# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,794 — 1961 දෙසැම්බර් 4 වැනි සඳුද — 4.12.1961**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## මිළ පාලන දන්වීම්

අංක 71 දරණ ආහාර මිළ නියෝගය | අතිරේක ආහාර ද්‍රව්‍ය

### 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

වවුනියාව දිසාවේ සහකාර මිළ (ආහාර) පාලක තැනවූ පරමනාදන් වෙල්වරත්නම් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වන කොටසේ 3 (2) වන වගන්තියෙන් මට ලැබී ඇති බලතල අනුව, මෙම නියෝගයෙන්—

(1) 1961 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 12,730 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1961 ඔක්තෝබර් 18 වැනි දින අංක වී. 70 දරණ මගේ ආහාර මිළ නියෝගය මෙයින් මෙවක් පටන් අවලංගු කරමි.

(2) මෙම දන්වීම අග ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍ය, වවුනියාව නගර සීමාව ඇතුළු, වවුනියා ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය තුළ, තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ, කොළඹ නගර සභා සීමාව තුළ, ඒ ඒ ද්‍රව්‍ය, තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි නියමික වැඩිම මිළට, මෙකී පළමුවන උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය. එලෙසම, සියඹලා සහ උම්බලකඩ හෝ බොනිටෝ පිෂ්, එකී ප්‍රදේශය තුළ, සිල්ලර වෙළෙන්දකු ශුද්ධ බර රාත්තලක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ, කොළඹ නගර සභා සීමාව තුළ, ඒ ඒ ද්‍රව්‍ය, සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලරට විකිණිය හැකි නියමිත වැඩිම මිළට, මෙකී උප ලේඛනයේ තුන්වන තීරයේ සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය.

(3) මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා—

(අ) මෙකී උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍ය, වරකට හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් බවටත්,

(ආ) ඒ ඒ ද්‍රව්‍ය පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ හොණ්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකුණනු ලබන්නේ නම්, ඒ සිල්ලර වශයෙන් විකිණීමක් බවටත් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙහි සඳහන් ප්‍රදේශයන්හි, මෙකී නියෝගයෙහි සඳහන් කිසිම ද්‍රව්‍යයක්, අන් දේ සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු නොවිකිණිය යුතුයි.

(5) තවද, මෙම නියෝගයෙහි සඳහන් සැම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක, මෙහි සඳහන් ද්‍රව්‍ය සිය ස්වාමිත්වයේ හෝ පාලන යේ තබාගෙන සිටින සැම වෙළෙන්දකුම එම ද්‍රව්‍ය ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා මේ නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩු නොවන ඉලක්කම්වලින් පුවරුවක ලියා, එම පුවරුව එම භාජනය අසලම සැම ගනුදෙනු කාරයෙකුටම පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතුයි.

(6) මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා, රාත්තල යනුවෙන් හැඟෙනුයේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව ගණන් ගන්නා රාත්තලයි.

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සැම ප්‍රදේශයකම, මෙහි අග ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණී මේදී, ඒවා මිළදී ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර ඇතුළු කුවිතාන්සියක් දිය යුතුයි :—

(අ) විකුණූ දිනය,
(ආ) බර අනුව විකුණූ ප්‍රමාණය,
(ඇ) ඒ සඳහා ගෙවූ මුදල,
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග.

(8) තවද, මෙකී ද්‍රව්‍ය යම් කිසි දෙයක බහා දෙන්නේ නම් නැතහොත් ඔතා දෙන්නේ නම්, එහි මිළත් මෙම නියෝගයෙහි සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන්නේය.

පී. වෙල්වරත්නම්,
වවුනියාව දිසාවේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

1961 නොවැම්බර් මස 27 වැනි දින,
පෙරවරු 10ට වවුනියා කච්චේරියේදී
අත්සන් තබන ලදී.

2197—ජේ. ඇන්. ඇර් 189—8,250 (12/61)

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැක්කේ කොළඹ නගර සහා සීමාව තුළ තොග වෙළෙන්දෙකු ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි නියමිත මිළට මෙහි ඇති මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැක්කේ කොළඹ නගර සහා සීමාව තුළ සිල්ලර වෙළෙන්දෙක් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි නියමිත මිළට මෙහි ඇති මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය |
| | රු. ශ. | රු. ශ. |
| සියඹලා ... ... | 2 71 | 0 03 |
| උම්බලකඩ හෝ බොනිටෝ පිෂ් | 3 71 | 0 04 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

12–271

---

අ. 86 දරණ ආහාර මිළ නියෝගය — අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝපිෂ්)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් වියුඩර් කරුණාතිලක දසනායක වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

1. 1950 අංක 29 දරණ මිළ පාලන පනත අනුව සකස්උනු කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් උම්බලකඩ හෝ බොනිටෝපිෂ් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද විකිණිය හැකි වැඩිම තොග මිළ සහ සිල්ලර මිළ ගණන්වලට මෙයට යාකොට ඇති උපලේඛනයේ 2(i) සහ (ii) හා 3(i) සහ (ii) යන තීරයන්හි සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 2 සහ 3 වෙනි තීරවල සඳහන් ප්‍රදේශ තුළ උපලේඛනයේ 1 වෙනි තීරයේ විස්තර කර ඇති උම්බලකඩ හෝ බොනිටෝපිෂ් විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිළ ගණන් ගතයුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

2. තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා —
   (අ) උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝපිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උම්බලකඩ හෝ බොනිටෝපිෂ් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,
   (ආ) උම්බලකඩ හෝ බොනිටෝපිෂ් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

3. එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උම්බලකඩ හෝ බොනිටෝපිෂ් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

4. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උම්බලකඩ හෝ බොනිටෝපිෂ් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් නියම කරන ලද වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, උම්බලකඩ හෝ බොනිටෝපිෂ් හා නියමිත වැඩිම මිළ ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

5. එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

6. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උම්බලකඩ හෝ බොනිටෝපිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උම්බලකඩ හෝ බොනිටෝපිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—
   (අ) විකුණූ දිනය ;
   (ආ) එම ද්‍රව්‍ය විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
   (ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
   (ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

7. තවද, උම්බලකඩ හෝ බොනිටෝපිෂ් යම්කිසි දෙයක බහා නැතහොත් ඔතා දෙන්නේ නම් එහි මිලත් මෙම නියෝගයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත් බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 28 වෙනි දින පස්වරු 3.20ට අනුරාධපුර දිසාපති කාර්‍ය්‍යාලයේදී අත්සන් තබන ලදී.

ටී. කේ. දසනායක,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය | 2වෙනි තීරය — අංක 23සී දරණ තුලාන ඇතුලත් අනුරාධපුර නගර සභා සීමාවත් හා කැකිරාව සුළු නගර සභා සීමාව ඇතුලත (i) | (ii) | 3 වෙනි තීරය — අනුරාධපුර නගර සභා සීමාව අංක 23සී දරණ තුලාන හා කැකිරාව සුළු නගර සභා සීමාවත් හැර අනුරාධ පුර පාලන දිස්ත්‍රික්කය (i) | (ii) |
|---|---|---|---|---|
| විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝ පිෂ් ... | 6 50 | 0 06 | 6 75 | 0 07 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

12–286

බීඩී/81 අංක දරණ ආහාර මිළ නියෝගය. අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝෆිෂ්)

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් තොග වෙළෙන්දකු වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් පළමුවෙනි උපලේඛනයේ සඳහන් අංක 1, 2, 3 සහ 4 දරණ ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(ii) තවද, මීට යාකර ඇති 3 වැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් පළමුවෙනි උපලේඛනයෙහි සඳහන් අංක 1, 2, 3 හා 4 දරණ ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් තුන්වැනි උපලේඛනයේ දෙවැනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් නැවත විකිණීම සඳහා හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා දළබර හොණ්ඩරයකට අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) "ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ" සියලුම තොග විකිණීම් සඳහා බලපවත්වන බවත් ;

(ඈ) "සිල්ලර වශයෙන් විකිණීමේදී වැඩිම මිළ" සියලුම සිල්ලර විකිණීම් සඳහා බලපවත්වන බවත් නියම කරමි.

(iv) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවැනි උපලේඛනයෙහි පළමුවැනි තීරයේ සහ තුන්වැනි උපලේඛනයෙහි පළමු වැනි තීරයෙහි සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(v) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක දෙවැනි උපලේඛනයේ පළමු වැනි තීරයේ සහ තුන්වැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(vi) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(vii) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවැනි උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා තුන්වැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ද්‍රව්‍යයේ විස්තර ;

(ඇ) විකුණූ ප්‍රමාණය ;

(ඈ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඉ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

(viii) දෙවැනි, තුන්වැනි උපලේඛනවල පළමුවැනි තීරයෙහි සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, එම උපලේඛනවල දෙවැනි තීරයේ සඳහන් මිළ ගණන්වල ඇතුළත්වන බවද නියම කරමි.

1961 ක්වූ නොවැම්බර් මස 28 වැනි දින ප.ව. 12.30 ට බදුලු කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇස්. ජේ. විජේසේකර,
බදුලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

### පළමුවෙනි උපලේඛනය

**අංක 1 දරණ ප්‍රදේශය.**

බදුල්ල නගර සභා සීමාව ; හාලිඇල නගරය ; දෙමෝදර කඩමන්ඩිය ; ඇල්ල කඩමන්ඩිය ; බල්ලකැටුව කඩමන්ඩිය ; හපුතලේ නගර සභා සීමාව ; බණ්ඩාරවෙල නගර සභා සීමාව ; වැලිමඩ සුළු නගර සභා සීමාව ; හල්දුම්මුල්ල නගරය ; කොස්ලන්ද නගරය ; දියතලාව නගරය.

**අංක 2 දරණ ප්‍රදේශය.**

පස්සර සුළු නගර සභා සීමාව ; හාලිඇල නගරය හැර බෝගොඩ ගම්කාර්ය සභා සීමාව ; දෙමෝදර කඩමන්ඩිය ; ඇල්ල කඩමන්ඩිය ; බල්ලකැටුව කඩමන්ඩිය හැර කුඹල්වෙල ගම්කාර්ය සභා සීමාව ; පාලුගම කඩමන්ඩිය ; දඹවිනි පළාත ගම්කාර්ය සභා සීමාව ; දෙහිවිනි පළාත ගම්කාර්ය සභා සීමාව ; හල්දුම්මුල්ල නගරය හැර කන්දපල්ල නො. 1 දරණ ගම්කාර්ය සභා සීමාව ; කොස්ලන්ද නගරය හැර කන්දපල්ල නො: 2 දරණ ගම්කාර්ය සභා සීමාව ; දියතලාව නගරය හැර මහාපලාත ගම්කාර්ය සභා සීමාව ; රිල්පොල ගම්කාර්ය සභා සීමාව.

**අංක 3 දරණ ප්‍රදේශය.**

පට්ටිපොල ගම්කාර්ය සභා සීමාව ; සොරණාතොට ගම්කාර්ය සභා සීමාව ; පස්සර ගම්කාර්ය සභා සීමාව ; මැදපළාත ගම්කාර්ය සභා සීමාව ; යටිපළාත ගම්කාර්ය සභා සීමාව ; ගම්පහ ගම්කාර්ය සභා සීමාව ; පාලුගම කඩමන්ඩිය හැර උඩපළාත ගම්කාර්ය සභා සීමාව ; වියළුව ගම්කාර්ය සභා සීමාව ; මීගහකිවුල ගම්කාර්ය සභා සීමාව.

**අංක 4 දරණ ප්‍රදේශය.**

පැල්වත්ත අරළුපිටිය ගම්කාර්ය සභා සීමාව ; මීගහකිවුල කඩමන්ඩිය හැර ඔයපළාත ගම්කාර්ය සභා සීමාව ; බින්තැන්න ගම්කාර්ය සභා සීමාව.

## දෙවෙනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය — තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන්. කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | |
|---|---|---|---|---|
| වර්ගය | අංක 1 දරණ ප්‍රදේශය | අංක 2 දරණ ප්‍රදේශය | අංක 3 දරණ ප්‍රදේශය | අංක 4 දරණ ප්‍රදේශය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් ... | 4 35 ... | 4 40 ... | 4 50 ... | 4 60 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකියි.

## තුන්වෙනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය — සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | |
|---|---|---|---|---|
| වර්ගය | අංක 1 දරණ ප්‍රදේශය | අංක 2 දරණ ප්‍රදේශය | අංක 3 දරණ ප්‍රදේශය | අංක 4 දරණ ප්‍රදේශය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් ... | 0 3 ... | 0 4 ... | 0 5 ... | 0 6 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකියි.

12–404/1

---

**මොන/දි/28 අංක දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝfපිෂ්)**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් තොග වෙළෙන්දකු වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් පළමුවෙනි උපලේඛනයේ සඳහන් අංක 1, 2 සහ 3 දරණ ප්‍රදේශයන් ඇතුළත් විකිණියහැකි වැඩිම මිළ මේ දන් පටන් දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ අනුපිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(ii) තවද, මීට යාකර ඇති 3 වැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් පළමුවෙනි උපලේඛනයෙහි සඳහන් අංක 1, 2 හා 3 දරණ ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන් තුන්වැනි උපලේඛනයේ දෙවැනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් නැවත විකිණීම සඳහා හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා දළබර හොණ්ඩරයකට අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) ''ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ'' සියලුම තොග විකිණීම් සඳහා බලපවත්වන බවත් ;

(ඈ) ''සිල්ලර වශයෙන් විකිණීමේදී වැඩිම මිළ'' සියලුම සිල්ලර විකිණීම් සඳහා බලපවත්වන බවත් නියම කරමි.

(iv) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවැනි උපලේඛනයෙහි පළමුවැනි තීරයේ සහ තුන්වැනි උපලේඛනයෙහි පළමුවැනි තීරයෙහි සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(v) තුවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක දෙවැනි උපලේඛනයේ පළමු වැනි තීරයේ සහ තුන්වැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබියයුතු බව නියම කරමි.

(vi) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(vii) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවැනි උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා තුන්වැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්:—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ද්‍රව්‍යයේ විස්තර ;

(ඇ) විකුණූ ප්‍රමාණය ;

(ඈ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඉ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

(viii) දෙවැනි, තුන්වැනි උපලේඛනවල පළමුවැනි තීරයෙහි සඳහන් උම්බලකඩ හෝ බොනිටෝfපිෂ් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, එම උපලේඛනවල දෙවැනි තීරයේ සඳහන් මිළ ගණන්වල ඇතුළත්වන බවද නියම කරමි.

1961ක්වූ නොවැම්බර් මස 28 වැනි දින ප. ව. 12.30ට බදුලු කච්චේරියේදී අත්සන්කරන ලදී.

ඇස්. ජේ. විජේසේකර,
මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## පළමුවෙනි උපලේඛනය

**අංක 1 දරණ ප්‍රදේශය**

වැල්ලවාය නගර සීමාව ; බූත්තල නගර සීමාව ; බිබිල නගර සීමාව ; මොණරාගල නගර සීමාව ; බඩල්කුඹුර කඩමන්ඩිය.

**අංක 2 දරණ ප්‍රදේශය**

වැල්ලවාය නගරය හැර වැල්ලවාය ගම්කාර්ය සහා සීමාව; බිබිල නගරය හැර වැගම්පත්තු නිල්ගල ගම්කාර්ය සහා සීමාව; බූත්තල නගරය හැර බූත්තල ගම්කාර්ය සහා සීමාව ; බඩල්කුඹුර කඩමන්ඩිය හැර කඳුකර ගම්කාර්ය සහා සීමාව.

**අංක 3 දරණ ප්‍රදේශය**

දඹගල්ල ගම්කාර්ය සහා සීමාව ; සිත්තරම් පළාත ගම්කාර්ය සහා සීමාව ; මොණරාගල නගරය හැර බූත්තල වැදිරට ගම්කාර්ය සහා සීමාව මොණරාගල දිස්ත්‍රික්කයට අයත්වෙන බින්තැන්න පත්තුවේ කොටස.

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | | |
|---|---|---|---|
| | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | |
| වර්ගය | අංක 1 දරණ ප්‍රදේශය | අංක 2 දරණ ප්‍රදේශය | අංක 3 දරණ ප්‍රදේශය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝ්පිෂ් ... ... | 4 40 ... | 4 50 ... | 4 60 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකියි.

## තුන්වෙනි උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | | |
|---|---|---|---|
| | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | |
| වර්ගය | අංක 1 දරණ ප්‍රදේශය | අංක 2 දරණ ප්‍රදේශය | අංක 3 දරණ ප්‍රදේශය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| දෙවෙනි උපලෙඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝ්පිෂ් ... ... ... | 0 4 ... | 0 5 ... | 0 6 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකියි.

12—404/2

---

**1961 අංක ඇම් ඇන්/10 දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

### 1950 අංක 29 දරන මිළ පාලන පනත

### නියෝගය

මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවෙන 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

1. 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනතේ සකස්වූ කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දනට විකිණිය හැකි උපරිම තොග මිළ ගණනට, මෙයට යාකර ඇති දෙවැනි උප ලේඛනයේ 2, 4 සහ 6 වැනි තීරයන්හි සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වෙනි තීරයෙහි විස්තර කරන ලද ද්‍රව්‍ය දළබර හොණ්ඩරයක් අනුපිළිවෙළින් ඇති (මෙයට යාකර ඇති පළමු වැනි උපලේඛනයේ සඳහන්) අංක 1, 2 සහ 3 යන ප්‍රදේශවල තොග වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

2. 1950 අංක 29 දරණ මිළ පාලන පනත යටතේ සකස්වූ කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් දනට විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ගණනට, මෙයට යාකර ඇති දෙවැනි උපලේඛනයේ 3, 5 සහ 7 වැනි තීරයන්හි සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උප ලේඛනයේ 1 වැනි තීරයෙහි විස්තර කරන ලද ද්‍රව්‍ය සිල්ලර රාත්තලක් අනුපිළිවෙළින් ඇති (මෙයට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ සඳහන්) අංක 1, 2 සහ 3 යන ප්‍රදේශවල සිල්ලර වශයෙන් මේ මොහොතේ පටන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

3. තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

   (අ) දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය වරකට දළබුර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

   (ආ) දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන ලබන බවත්,

   (ඇ) දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය සියල්ල හෝ යම්කිසි ආහාර ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමට පුරුදුව සිටින කවරෙකු හෝ "තොග වෙළෙන්දකු" ලෙස සලකන බවත්,

   (ඈ) "සිල්ලර වශයෙන් විකිණීමේදී වැඩිම මිළ" සියලුම සිල්ලර වශයෙන් විකිණීම සඳහා බල පවත්වන බවත්,

   (ඉ) දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ද්‍රව්‍යවල "ශුද්ධ" යන්නෙන් හැඟවෙන්නේ දළබරින් කාරබර අඩුකොට ඉතිරිවන බර හෝ නැතහොත් ද්‍රව්‍යයන්ගේ පමණක් බර බවද නියම කරමි.

4. මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් කිසිම ආහාර ද්‍රව්‍යයක් අන්‍ය ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

5. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයකට දමා ඒ ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍ය සඳහා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථාන යේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

6. එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

7. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, දෙවෙනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා දෙවැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) ආහාර ද්‍රව්‍ය විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන බව ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

8. දෙවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙත්නම් එහි මිළත් දෙවෙනි උපලේඛනයේ 2,,3, 4, 5, 6 සහ 7 වැනි තීරවල සඳහන් මිළ ගණන්වලට ඇතුළත් බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 30 වෙනි දින අපර භාග 3 ට මන්නාරම් කොටුවේ ආහාර පාලන කාර්‍යාලයේදී අත්සන් කරන ලදී.

ආහාර පාලන කාර්‍යාලය,
කොටුව, මන්නාරම,
30-11-1961.

ඇස්. පරමනාදන්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## පළමුවැනි උපලේඛනය

| පළමුවෙනි ප්‍රදේශයට අයත් සීමාවන් | දෙවැනි ප්‍රදේශයට අයත් සීමාවන් | තුන්වැනි ප්‍රදේශයට අයත් සීමාවන් |
|---|---|---|
| මන්නාරම් සුළු නගර සභා ගම්කාර්‍ය සභා ප්‍රදේශ, මන්නාරම නැගෙනහිර, මන්නාරම බටහිර (තලේ මන්නාරම් ගම්මුලාදෑණි ප්‍රදේශය හැර), ඉරුකුලම් පිට්ටි, වන්කාලෙයි, මාන්තෙ දකුණ, නානාට්ටන් නැගෙනහිර සහ නානාට්ටන් බටහිර | තලේමන්නාරම ගම්මුලාදෑණි කොට්ඨාශය, මාන්තෙ උතුර, පෙරුන්කාලිපත්තු (පෙරියමඩු ජනපදය හැර), මුසලි උතුර, මුසලි දකුණ සහ මරිච්චකට්ටි (ගම්මුලාදෑණි ප්‍රදේශය හැර) | පෙරියමඩු ජනපදය, ඉලුපකඩවෙයි, මුසලි දකුණ මරිච්චකට්ටි ගම්මුලාදෑණි කොට්ඨාශය, පතන් කාමම් සහ මේත්කුමුලෙයි |

## දෙවෙනි උපලේඛනය

| පළමුවැනි තීරය | පළමුවැනි ප්‍රදේශය | | | දෙවෙනි ප්‍රදේශය | | | තුන්වැනි ප්‍රදේශය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙවැනි තීරය | | තුන්වැනි තීරය | | සතරවැනි තීරය | | පස්වැනි තීරය | | හයවැනි තීරය | | හත්වැනි තීරය |
| වර්ගය | තොග වෙළෙන්දකු විසින් දලබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | සිල්ලර වෙළෙන්දකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | තොග වෙළෙන්දකු විසින් දලබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | සිල්ලර වෙළෙන්දකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | තොග වෙළෙන්දකු විසින් දලබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | සිල්ලර වෙළෙන්දකු විසින් රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝ ෆිෂ් ... | 4 25 | ... | 0 04 | ... | 4 40 | ... | 0 04 | ... | 4 50 | ... | 0 04 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

12–388

---

සී. 336 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

සීනි (සකස් නොකළ දුඹුරු හා සකස් කළ සුදු)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මිල (ආහාර) පාලක තැන්පත් රෙජිනෝල්ඩ් ලෝරන්ස් ආර්නෝල්ඩ් වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1961 ජූලි මස 28 වෙනි දින හා 12,563 අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 1961 ජූලි මස 28 වෙනි දතමින් පළ කරන ලද සී. 322 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීනි, තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් ද, සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද, කොළඹ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දින් පටන් මේ උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම් සඳහා විකිණීම හෝ වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීනි පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ඇ) ''සීනි'' වලට කිසිම හකුරු වර්ගයක් ඇතුළත් නොවිය යුතු බවත්;

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, සීනි වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල්කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම සීනි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම සීනි සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී සීනි හා නියමිත වැඩිම මිල ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) සීනි විකුණූ ප්‍රමාණය හා වර්ගය (බර අනුවයි) ;

(ඇ) විකුණූ සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීනි විකුණන විට ඒ විකුණනු ලබන සීනි යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිලත්, උපලේඛනයේ 2 වෙනි සහ 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1961 දෙසැම්බර් 4 වෙනි දින පෙ.ව. 9 ට කොළඹ දී අත්සන් කරන ලදී.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
මිළ (ආහාර) පාලකතැන.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| වර්ගය | දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| සකස් නොකළ දුඹුරු සීනි ... ... ... | 58 33 ... | 0 55 |
| සකස් කළ සුදු සීනි ... ... ... | 65 53 ... | 0 62 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

12—495

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.